ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
Zonal Education Office - Minuwangoda

# සුවෙන් පෙරට ඉගෙනුම් පියස.

# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය.

# 2021: වාරය-2

| විෂය - බුද්ධ ධර්මය | ශ්‍රේණිය - 10 | පාඩම - සබඳතා රකින මිනිස් යුතුකම්. |
|---|---|---|

හැඳින්වීම :

1. සමාජ කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය සමාජයක යහපැවැත්මේ පදනමයි.
2. ඒ සඳහා බුදුන්වහන්සේ සිඟාල නම් ගෘහපතියාට දේශනා කළ සිඟාලෝවාද සූත්‍රයේ ඇතුළත් 'සදිසා නමස්කාරය' තුළින් මග පෙන්වා ඇත.
3. බුදුන් වහන්සේ ඒ ඒ සමාජ කොටස් අතර ඉටුවිය යුතු යුතුකම් සවිස්තරව සිඟාලෝවාද සූත්‍රයේ දී දේශනා කර ඇත.
4. අන්‍යෝන්‍ය යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීමෙන් සමාජයේ සාමය ,සහයෝගය මෙන්ම දියුණුව හා සතුට ද ළඟා කරගත හැක.

සිඟාලෝවාද සූත්‍රයට අනුව සදිසාවෙන් සමාජය 6 ආකාරයකට දක්වා ඇත.

1.නැගෙනහිර දිසාව - මව්පියන්
2.දකුණු දිසාව - ගුරුවරුන්
3.බටහිර දිසාව - ස්වාමි-භාර්යා
4.උතුරු දිසාව - හිතමිතුරන්
5.යට දිසාව - සේවක සේවිකාවන්
6.උඩ දිසාව - පැවිදි උතුමන්.

සමාජ කණ්ඩායම් වශයෙන් හය ආකාරයක් වේ.

1. දෙමාපියන් සහ දූ දරුවන්
2. ගුරුවරුන් හා සිසුන්
3. ස්වාමි-භාර්යා
4. මිතුරන් සහ තමන්
5. සේවක හා සේවිකාවන්
6. පැවිදි ගිහි   වශයෙනි.

මෙම කණ්ඩායම් 6 අන්‍යෝන්‍ය වශයෙන් ඉටු කළ යුතු යුතුකම් 61 සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වේ.

පැවරුම :

1. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන සදිසා නමස්කාරය තුළින් අන්‍යෝන්‍ය වශයෙන් ඉටු කළ යුතු යුතුකම් පහත දැක්වෙන ආකාරයෙන් වගුගත කරන්න

උදාහරණ :

| දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම්. | දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවියයුතු යුතුකම්. |
|---|---|
| 1<br>2<br>3<br>4<br>5<br>6 | 1<br>2<br>3<br>4<br>5<br>6 |

2. තම යුතුකම් හා වගකීම් ඉටු කිරීමෙන් සමාජ සම්බන්ධතා ගොඩනැගෙන ආකාරය පෙන්වා දෙන්න.

3. "මාතා පිතා දිසා පුබ්බා" යන ගාථාව කටපාඩමින් ලියන්න.